**ශීර්ෂය 274 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 04 ක රු.99,541,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.10,131,504 ක බැරකම් සඳහා බැදීම් ඇති කරගෙන තිබුණි. | • 274-1-1-0-1002 යටතේ අත්‍යවශ්‍ය රාජකාරීන් සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට සිදුවීම මත මෙම බැරකම ඇති වී තිබුණි.<br>• 274-1-1-0-1404 යටතේ අනුරාධපුර මහනගර සභාව විසින් වාර්ෂිකව වරිපණම් තක්සේරු කර ලබාදෙන අතර වරිපණම් ගෙවීම අනිවාර්ය වීමක් බැවින් මෙම බැරකම අනිවාර්ය වේ.<br>• 274-1-1-0-2001 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි සහ නිල නිවාසවල අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම හේතුවෙන් මෙම අතිරේක බැරකම් සිදුවී තිබුණි.<br>• 274-1-1-0-2104 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගිවිසුම් ගත වූ අතර මෙම බැරකම් 2020 වර්ෂයේ ප්‍රතිපාදන වලින් නිරවුල් කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස හඳුනා නොගත් වැය විෂයයන් 04 කට අදාළව රු.10,176,691 ක් 2021 වර්ෂයෙහි ගෙවා තිබුණි. | • 274-1-1-0-1001 කැකිරාව ප්‍රාදේශීය ලේකම්වරිය විදේශ ශිෂ්‍යත්වයකින් පසු සේවයට වාර්තා කිරීම නිසා 2020 දෙසැම්බර් සහ 2021 ජනවාරි වැටුප ගෙවීම මෙයට හේතු විය.<br>• 274-1-1-0-1402 2020 දෙසැම්බර් මාසයට අදාළ දුරකථන බිල්පත් මූල්‍ය ප්‍රකාශනවලට තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ලැබීම හේතුවෙන් බැරකම් හඳුනාගත නොහැකි විය. | වර්ෂයට අදාළ වියදම් වෙනුවෙන් ඇස්තමේන්තු කර බැරකම් අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

- 274-1-1-0-1403 2020 දෙසැම්බර් මාසයට අදාළ විදුලි බිල්පත මුලා ප්‍රකාශනවලට තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ලැබීම හේතුවෙන් බැරකම් හඳුනාගත නොහැකි විය.
- 274-1-1-0-2104 මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත් වේ.

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අමාත්‍යාංශ 37 ක් හා දෙපාර්තමේන්තු 23 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 3210 ක් හා රු.මිලියන 462 ක් ලෙස එකතුව රු.මිලියන 3,672 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3,231 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 441 ක් හෙවත් සියයට 13 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. අමාත්‍යාංශ 08 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 16 සිට සියයට 59 ක් දක්වා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. දෙපාර්තමේන්තු 04 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 19 සිට සියයට 29 දක්වා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | • සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ ගෙවීම් කරන ප්‍රතිආසෘතිකරණ ජල පද්ධතිවල අපේක්ෂා කළ පරිදි විදුලි බිල්පත් පියවීමට බිල්පත් ඉදිරිපත් නොවූ බැවින් මෙම ප්‍රතිපාදන ඉතිරි වීම සිදුවේ.<br>• උසස් අධ්‍යාපන , තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ නිපුණතා සංවර්ධන රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය 2020 අගෝස්තු මාසයෙන් අනතුරුව සිදු කරන ලද අමාත්‍යාංශ සංශෝධනයට ලක්වී ඇති බැවින් මෙම අමාත්‍යාංශය යටතේ වියදම් නොදැරීම.<br>• කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ අපේක්ෂා කළ පරිදි තාරුණ්‍ය බලගැන්වීමේ වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.<br>• මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් වෙන්කරන ලද මුදල් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි 03 ප්‍රකාරව වියදම් සැලසුම් කිරීම සිදුකළ යුතු වේ. |

- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වෙන්කරන ලද මුදල් පැවති කොවිඩ් වසංගත තත්වය නිසා පූර්ණ ලෙස උපයෝජනය කිරීමට නොහැකි විය.
- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් වියදම් කළමනාකරණය කිරීම සහ අපේක්ෂිත වියදම් වර්ෂය තුළ පැන නොනැගීම මත මෙම ඉතිරිවීම සිදු වී ඇත.
- සංවර්ධන මූලා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනවලින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී රු.210,000 ක ඉතිරියක් පැවතීම මෙයට හේතු වී ඇත.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2009 ජුනි 22 දිනැති අංක 2/2009 දරන හා 2020 අගෝස්තු 31 දිනැති අංක 03/2020 දරන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2.2 ඡේදය | එකම සේවා ස්ථානයේ වසර 5 ක් ඉක්මවා සේවය කරන නැගෙනහිර නුවරගම් පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරීන් 07 දෙනෙකු සහ සංවර්ධන නිලධාරීන් 24 දෙනෙකු වසර 6 සිට 12 දක්වා කාලයක් ද, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමණාකරණ සේවා නිලධාරීන් 03 දෙනෙකු වසර 7 සිට 10 දක්වා කාලයක් ද, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරීන් 3 දෙනෙකු වසර 6 සිට 8 දක්වා කාලයක්ද ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරින් 04 දෙනකු සහ තොරතුරු තාක්ෂණ නිලධාරියකු වසර 10 ත් 13 ත් අතර කාලයක්ද ස්ථානමාරු නොලබා අඛණ්ඩව සේවයේ නියුක්ත වී තිබුණි. | එකම සේවා ස්ථානයේ වසර 5 ඉක්මවා සේවය කරන නිලධාරීන් සිටින බව පිළිගත හැකිය. පහත සඳහන් හේතූන් මත වසර 05ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු කිරීමට නොහැකි විය.<br>**i.** නිලධාරීන් ස්ථානමාරු ඉල්ලා සිටියද ඒ වෙනුවට පත් කළයුතු සුදුසු අනුප්‍රාප්තික නිලධාරීන් නොමැති වීම.<br>**ii.** සේවය වසර 05ට වැඩි වුවද ඇතැම් නිලධාරීන්ගේ මානුෂීය කාරණා හේතුවෙන් ඇතැම් නිලධාරීන් ස්ථානමාරු කිරීමට නොහැකි වීම.<br>**iii.** ස්ථාන මාරු කිරීම සඳහා ඔවුන්ට පහසු සේවා ස්ථාන නොමැති වීම. | චක්‍රලේඛයේ 2.2.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 104(4) | තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට පත් වී රු.431,712 ක් වියදම් දරා අලුත්වැඩියා කර තිබූ නමුත්, අනතුරට වගකිව යුත්තන් හඳුනාගැනීම සඳහා පරීක්ෂණ සිදු කර නොතිබුණි. | මෙම අනතුරට අදාල නඩු විභාගය 2021.04.21 දිනට කල්තබා තිබූ අතර නඩු විභාගයේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස 2021.05.31 දින තිරප්පනේ පොලිස් ස්ථානාධිපති වෙත දන්වා යවා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

3. **මෙහෙයුම් සමාලෝචනය**
**-----------------------------**

3.1 **කාර්යභාරයන් ඉටු නොකිරීම**
**---------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සියළු ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ 2020 ජනවාරි 13 දිනැති අංක NSE/DVE/04 /02/03/11 දරන ලිපිය ප්‍රකාරව තම කොට්ඨාසය තුළ සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා එක් වරක් පමණක් ගෙවන රු.30,000 ක ස්වයංරැකියා ආධාර ලබාදීම සඳහා කටයුතු කරන ලෙස දන්වා තිබූ නමුත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක් තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | • මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභී නැඹුරුවක් නොමැතිවීම මත අයදුම්පත් ඉදිරිපත් නොවීම සහ පැවති කොරෝනා වසංගත තත්වය නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.<br>• හොරොව්පොතාන, තලාව, තිරප්පනේ, පලාගල, මහවිලච්චිය සහ කහටගස්දිගිලිය ය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැවති කොරෝනා තත්ත්වය තුළ සුදුසු ප්‍රතිලාභීන් තේරීම් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමට හේතුවිය.<br>• රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අතපසුවීමකින් එම තොරතුරු යවා නොමැති බව පිළිගනිමි.<br>• කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අයදුම්පත් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති අතර, ඊට අදාළ ප්‍රතිපාදන 2020 වර්ෂයේදී නොලැබුණු බැවින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත.<br>• ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අයදුම් පත්‍ර ලබාගත් පුද්ගලයන් විසින් අයදුම්පත්‍ර නිවැරදිව සම්පූර්ණ කර කාර්යාලය වෙත ලබා දී නොමැත. | ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කරන වැඩසටහන් තම කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරවා ගැනීමට ප්‍රමාණවත් උත්සාහයක් දැරිය යුතු වේ. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක අනුමත ප්‍රතිපාදන රු.87,879,500 කින් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 14 ක් නිමකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒ සඳහා දැරූ වියදම රු.7,505,919 කි. | • කැබිතිගොල්ලෑව - මෙම ප්‍රදේශයට ඇදහැලෙන මහ වර්ෂාව නිසා මෙම ව්‍යාපෘති අදාළ කාලය තුළ නිම කර ගැනීමට නොහැකි වුවත් මේ වන විට අදාළ ව්‍යාපෘති දෙක නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.<br>• මහවිලච්චිය - හැන්දෑගම පොහොර ගබඩාවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ පැවැති බලපෑම නිසා මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ අතර මේ වන විට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.<br>• තිරප්පනේ - පැවැති වර්ෂා තත්ත්වය හා කෘෂි මාර්ගයේ ගමන්මග කුඹුරු ඉඩම් හරහා යාම නිසා එම මාර්ගය ඉදිකිරීමට උපකරණ හා යන්ත්‍ර භාවිතය අසීරු විය. මාර්ගය හරහා වගල් කුඹුරු කොටසක් පැවතීම නිසා මාර්ගයේ වගල් සහිත ඉතිරි කොටස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.<br>• නොච්චියාගම - නීත්‍යානුකූල බොරළු බලපත්‍ර ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියට අවශ්‍ය බොරළු ප්‍රමාණය නියමිත කාලයට සපයා ගැනීමට නොහැකි වීමත්, වර්ෂ අවසානයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීමට ඇති වූ බාධාවත් හේතුවෙන් ව්‍යාපෘති 07ක් නිම කිරීමට නොහැකි විය. | අදාළ වර්ෂය තුළ ව්‍යාපෘති අවසන් කළ හැකිවන සේ ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාල සටහනක් සකස් කර ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | • නාච්චාදූව - ව්‍යාපෘති අංක 01 - SG/C/22/264/RA/1846 දරන ව්‍යාපෘතියෙහි රු.311,388.93 ක මුදලට අදාළ වැඩ කොටස් නිම කර නොතිබුණි. එහිදී කොන්ත්‍රාත්කරු විසින් අධික වර්ෂාව හේතුවෙන් එම වැඩ කොටස් අවසන් කිරීමට නොහැකි වූ බව ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත.<br>ව්‍යාපෘති අංක 02- SG/C/22/269/RA/325 දරන ව්‍යාපෘතියෙහි රු 607,600.68 ක මුදලක වැඩ කොටස නිමකර නොතිබූණි. | |
| (ආ) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පලුගස්වැව ගොවිපල වසමේ ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.1,980,000 ක් වියදම් දරා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් කණු මත වහලයක් සකස්කර ගොඩනැගිල්ලක අඩක් නිමකර තිබූ අතර, ව්‍යාපෘතිය අවසන් වන තුරු අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි මට්ටමක පැවතුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර, ඉදිරි වර්ෂවල මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සිදු කර නොතිබුණු බැවින් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | සපිරි ගමක් සංවර්ධන වැඩසටහන යටතේ " පලුගස්වැව ගොවිපල වසමේ ස්වයංරැකියා පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම " නමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. තවද ඊට අමතරව මෙම ග්‍රාමයේ පවත්වනු ලබන විවිධ සමිති සමාගම් වල රැස්වීම් හා පුහුණු වැඩසටහන් සඳහාද මෙම ගොඩනැගිල්ල යොදා ගැනීම, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් බලාපොරොත්තු විය. | මුළු පිරිවැය ඇස්මේන්තුවක් පිළියෙල කර ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව වෙන් කරවා ගත යුතුයි. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලැබෙන සේ ව්‍යාපෘති තෝරාගත යුතු වුවත් සපිරි ගමක් ජනතා සහභාගිත්ව සංවර්ධන වැඩසටහන යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතියක් ප්‍රතිලාභීන් දෙදෙනකු ඉලක්කකර ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය. | **නැ.නු.ප - ප්‍රා.ලේ. 249 පළමු පියවර පළමු පටුමග මී. 100 ක් කුට්ටිගල් අල්ලා ප්‍රතිසංස්කරණය කිරීම.**<br>මෙම ව්‍යාපෘතියේ සක්‍යතාවය ඉදිරිපත් කිරීමේ දි අඩු ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ඇති බව පෙන්වා දුන්නද එම මාර්ගය වක්‍ර ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් (එම මාර්ගයේ පදිංචි පුද්ගලයින්ගෙන් සේවාවන් ලබාගැනීමට පැමිණිම) භාවිතා කරන බැවින් එම මාර්ගය සංවර්ධනය නොකර සිටීමට නොහැකි තත්වයක් පැවතුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ඉලක්ක කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් ඩ්යාස 07 ක රු.10,053,500 ක ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | • මිහින්තලේ - මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට යාමේදි දැඩි මහජන විරෝධයක් මතු වීම නිසා නව ව්‍යාපෘති සංශෝධනයක් අනුමැතිය සඳහා යොමු කලද ඒ සඳහා අනුමැතිය නොලැබිම.<br>• මැදවච්චිය - කැළෑගම අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම<br>මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය මගහැරීම. දාඹුවැවේ සොරොව්ව හා එක් වාන් ඇලක් ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රදේශයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් වැවේ ජල මට්ටම ඉහල යාම.<br>• රඹෑව - ව්‍යාපෘති 02ක ක්‍රියාත්මක කළ රඹෑව ප්‍රාදේශීය සභාව එම ව්‍යාපෘතිවල වැඩ ආරම්භ නොකිරිම.<br>• කැබිතිගොල්ලෑව - වෙන්කල මුදල් ප්‍රමාණවත් නොවීම<br>• නොච්චියාගම - "පහමුනේගම ගම්මානය සඳහා නළ ළිඳක් ඉදි කිරීම." කැනීම සඳහා මීටර් 60 ක් නිර්දේශ කර තිබුණද, එම ප්‍රමාණය කැනීම සිදු නොකිරීම.<br>• පදවිය - ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලවකවානුවේ දී පැවති අධික වර්ෂාව හා බොරළු නොමැති වීම.<br>• ගලෙන්බිඳුනුවැව - ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාර සොයාගැනීමට නොහැකිවිම හේතුවෙන් ඉහත කී ව්‍යාපෘති අත්හැරීමට සිදුවිය. | අදාළ වර්ෂය තුළ ව්‍යාපෘති අවසන් කළ හැකිවන සේ ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාල සටහනක් සකස් කර ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හේන් බිමෙන් තිරසාර වාණිජ ගොවිපලක් ව්‍යාපෘතිය සඳහා රු.2,057,000 ක් වටිනා සූර්ය බල ජල පොම්පයක් මිලදී ගැනීමේදී ප්‍රමාණවත් තරඟකාරීත්වයක් ඇතිවන ආකාරයට ලංසු කැඳවීම සහ ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම සිදු කර නොතිබීම හේතුවෙන් එම ජල පොම්පය එක් සැපයුම්කරුවෙකු ඉදිරිපත් කළ මිල ගණන් පදනම් කරගෙන මිලදී ගෙන තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණ සත්‍යයකි. එසේ වුවද මෙම ප්‍රසම්පාදනයට අදාළ පිරිවිතර,කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන අදාළ ප්‍රසම්පාදනය සිදු කරන ලදී. මෙම මිළ ගණන් කැඳවීමේදී සිදු වූ දෝෂය නිසා මෙම කාර්යයන් දෙක සඳහා ම මිල ගණන් කැඳවා තිබුණි. එසේ වුවත් තාක්ෂණික ඇගයීමේදී ජල පොම්පය සැපයීම සඳහා වෙන්කර ඇගයීම සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි තරඟකාරී පදනමින් සැපයුම්කරුවන් තෝරා ගතයුතු වේ. |

## 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ලියාපදිංචි වී ඇති දැනට ප්‍රාදේශීය ලේකම්වරුන් භාරයේ පවතින වාහන 02 ක් භාවිතයෙන් ඉවත් කර තිබූ නමුත්, ඒවා 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 ප්‍රකාරව කටයුතු කර අපහරණය කර නොතිබුණි. | මෙම වාහන සම්බන්ධව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් තොරතුරු ලබා ගෙන ඇති අතර ඉදිරියේදී අපහරණ කටයුතු කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ ඉඩම් ආඥා පනතේ 196.1(vi) සහ 215 (6) වගන්ති ප්‍රකාරව, රජයේ ඉඩමකින් කළුගල් කැණීම් වැනි වාණිජ කටයුත්තක් සඳහා බාහිර පාර්ශවයන්ට ලබාදීමේදී ඉ.කො.78 බලපත්‍රයක් ලබාදිය යුතු බවත්, එම බලපත්‍රය මත ඉඩමේ වර්තමාන වෙළඳපොල වටිනාකමින් සියයට 4 ක් බදු කුලී වශයෙන් අයකළ යුතු බවත් දක්වා ඇත. නමුත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 09 කට කළුගල් කැණීම් බලපත්‍රලාභීන් 63 දෙනෙකුට ඉඩම් පරිහරණය කිරීම සඳහා ඉ.කො.78 බලපත්‍ර ලබා දී නොතිබුණු අතර, එම ඉඩමේ වර්තමාන වෙළඳපොල වටිනාකම මත අයකළ යුතු බදු මුදල් එම ඉඩම් භුක්ති විඳින්නන්ගෙන් වසර 01 සිට 14 ක කාලයක් තිස්සේ අයකර නොතිබුණි. | රජයේ ඉඩම් වලින් කළුගල් කැණීම් සිදු කිරීමේදී ඉඩම් පරිහරණය සඳහා ඉ.කො. 78 වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කර වාර්ෂික බදු මුදල් අයකරන ලෙස දිස්ත්‍රික් ලේකම්ගේ අංක ANU/DIST/3/4/8/B/3 හා 2021.04.22 දිනැති ලිපිය මගින් සියළු ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කර ඇත. | රාජ්‍ය ඉඩම් ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 8(2) වගන්තිය ප්‍රකාරව ඉඩම් විෂය භාර ඇමතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව සැකසුණු 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශීය ලේකම්වරු යටතේ පාලනය වන රජයේ ඉඩම් වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීම් හා ලබාගැනීම් වෙනුවෙන් ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට රජයේ ගාස්තු අයකළ යුතු විය. එහෙත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ විගණනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක පවත්වාගෙන යන කළුගල් වැඩබිම් 55 කින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය නිකුත් කර තිබූ කලුගල් කැණීම් බලපත්‍රවල සඳහන් ගල් කියුබ් ප්‍රමාණය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ රජයේ ගාස්තු ආදායම රු.මිලියන 295 ක් අයකරගෙන නොතිබුණි. 2020 පෙබරවාරි මස සිට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉහත කී රජයේ ගාස්තු අය කිරීම සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි. | අයකල යුතු ගාස්තු පිළිබඳව අධ්‍යයනය කර නිශ්චිත උපදෙස් ලබා දෙන තෙක් 2009/05/06 දිනැති අංක 1600/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රය පරිදි රජයේ ගාස්තු අය කිරීම තාවකාලිකව නතර කරන ලෙස සියළු ප්‍රාදේශිය ලේකම් වරුන් දැනුවත් කරන ලදී. මේ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පසු ඉඩම් පරිහරණය සඳහා ඉ.කො. 78 වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කර වාර්ෂික බදු මුදල් අයකල යුතු බව තීරණය කල අතර, ඒ පිළිබඳ ප්‍රාදේශිය ලේකම් වරුන් දැනුවත් කරන ලදී. ඉ.කො. 78 බලපත්‍රය අනුව වාර්ෂික බදු මුදල අය කිරීමේදී රජයේ ගාස්තුව අය නොකිරීමටත් යම් අයුරකින් ඉ.කො. 78 බලපත්‍රය නිකුත් කිරීම ප්‍රමාද වන්නේ නම් පමණක් එතෙක් රජයේ ගාස්තුව අයකරන ලෙසත් ප්‍රාදේශිය ලේකම් වරුන්ට උපදෙස් ලබාදී ඇත. | 1600/18 අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ගාස්තු අය කළ යුතු වේ. |
| (ඇ) | දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21 ක ක්‍රියාත්මක කර තිබූ කාන්තා කාර්යාංශ ණය වැඩසටහන් යටතේ නිකුත් කළ ණය වලින් වසරකට වඩා වැඩි කාලයක් වාරික අය නොවන අක්‍රිය ණය එකතුව රු.5,530,631 ක් විය. ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක බැංකු ගිණුම්වල රු.12,560,764 ක මුදලක් ණය වැඩසටහන සඳහා යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | මෙම ණය ගෙවීම් පැහැර හැර ඇති බොහොමයක් ආර්ථික දුෂ්කරතා හේතුවෙන්ද , තව සමහරෙක් ප්‍රදේශය හැර යාම, මිය යාම වැනි හේතු මතද වාරික අය නොවී පවති. 2020 වර්ෂය ආරම්භයේදීම මැතිවරණයක් ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් හා වසර පුරා පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අපගේ බල මණ්ඩල රැස්කිරීම් සිදු නොවීය. දැනටමත් සමථ මූල මණ්ඩල හරහා ණය අයකර ගැනීමේ කටයුතු වල නියැලේ. | ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඈ) | සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනෙළුඹෑව වාන් ඇල පැති බැම්ම සැකසීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,980,000 ක් වැය කර තිබූ නමුත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් සැලැස්මට හා ඉංජිනේරු උපදෙස් වලට පටහැනිව මෙම | මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති ව්‍යාපෘතියකි. ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරුගේ අංක DE1/NA/W/544 හා 2020.02.07 දිනැති ලිපිය හා එවන ලද සැලැස්මට අනුව ගම්වාසීන්ගේ දැඩි ඉල්ලීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉංජිනේරු උපදෙස් වලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර අනුගමනය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් සිදු කර තිබීම හේතුවෙන් ඉදි කර මාස 06 ක් ගතවීමටත් පෙර එම පැති බැම්ම ඇලට පෙරළී විනාශ වීම හේතුවෙන් දැරූ සම්පූර්ණ මුදල් නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, අදාල ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දුන් සැලැස්ම අනුවම සිදු කර ඇති බව වැඩි දුරටත් දන්වනු කැමැත්තෙමි. | |
| (ඉ) | නව සමෘද්ධි හිමිකම්පත් ප්‍රදානය පිළිබඳව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව ප්‍රතිලාභීන් 84 දෙනෙකුගෙන් 46 දෙනෙකුම එනම් සියයට 55 ක්ම හිමිකම් ලැබීමට සුදුසුකම් නොමැති බව නිරීක්ෂණය විය. බොහෝ අවස්ථාවල ප්‍රමුඛතා ලේඛනවල ඉහළ සිටින අය අතහැර අවසන් කිහිප දෙනෙකු වෙත මෙම ප්‍රතිලාභ ලබාදී තිබුණු අවස්ථාවන් පවතින බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මෙම කාර්යාලය මගින් කරන ලද සමීක්ෂණය පරිදි සහනාධාර ලබා දීමට සුදුසු ප්‍රතිලාභීන්ගේ ප්‍රමුඛතාවයට අනුව නාම ලේඛණය සකස් කරන ලදි. ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ලේඛණය දිස්ත්‍රික් අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලදි. ඒ අතරින් ප්‍රධාන කාර්යාලය විසින් තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා පමණක් හිමිකම් පත්‍ර මෙම කාර්යාලය වෙත ලබා දීමෙන් අනතුරුව අදාල ප්‍රතිලාභීන් වෙත එම හිමිකම් පත් ලබාදෙන ලදි. ඒ.අනුව එය සංශෝධනය කිරීමේ හැකියාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නොවිය. | සමීක්ෂණයට අනුව සුදුස්සන් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු වේ. |

## 4. යහපාලනය

-------------

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 302, කටුකැලියාව, ග්‍රාම නිලධාරී වසමේ පදිංචිකාරියකට අයත් අක්කර 01, රූඩ් 02 ක් වූ ඉඩම් කැබැල්ලක් ඉහත කී දීමනා පත්‍රකාරියගේ කැමැත්තෙන් තොරව ඇයගේ පුත්‍රයෙකුට ව්‍යාජ ලේඛනයක් සකසා 1997 සැප්තැම්බර් 03 දින පවරා තිබුණි. එම හේතුවෙන් ඉඩම් ආරවුලක් නිර්මාණය වී තිබූ අතර, මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් මෙම පැවරීම නීත්‍යානුකූල නොවන බව සඳහන් කරමින් 2017 අගෝස්තු 09 දින එම දෝෂය නිවැරදි කරන ලෙස මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා තිබූ නමුත්, එය මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා ඉඩමෙන් පර්චස් 50ක් තම මව වන දිසානායක මුදියන්සේලාගේ බිසෝමැණිකේ යන අය වෙත ලබාදීමට ජේ.එම්.ජී.එස්.කරුණාරත්න යන අය එකඟ වූ අතර ඒ අනුව පැවරීමට අදාල ලේඛන ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස ජේ.එම්.ජී.එස්.කරුණාරත්න යන අය වෙත දන්වා ඇත. අදාල ලේඛන ඉදිරිපත් කළ පසු පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන අතර එය මෙම ගැටළුව සමථයකට පත් කිරීම සඳහා සුදුසුම ක්‍රියාමාර්ගය වනු ඇති බවත් නිරීක්ෂණය වේ. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කළයුතු වේ. |

## 4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් තනතුරු 03 ක, සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 04 ක, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 13 ක හා පරිපාලන නිලධාරී තනතුරු 15 ක පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පැවතුණි. | අදාළ පුරප්පාඩු පවතින බව පිළිගනිමි. මෙම පුරප්පාඩු සහිත තනතුරුවල පත්වීම් බලධරයා වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වේ. අදාළ පුරප්පාඩු සම්බන්ධව මාසිකව **MISCO** දත්ත පද්ධතිය මඟින්ද ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මඟින් ද තොරතුරු වාර්තා කරනු ලබයි. එසේම අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස විටින් විට ඉල්ලීම් ද කරනු ලැබේ. එහෙත් අදාළ පුරප්පාඩු තනතුරුවල කාර්යයන් සුදුසු නිලධාරීන් වෙතින් ආවරණය කිරීමට වැඩ පිළිවෙලක් යොදා ඇත. | අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |